# සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය

සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, හා සේවායෝජකයන් සතුව ඇති තොරතුරු වල පවතින විෂමතාව ඉවත් කර පොදු දත්ත පද්ධතියක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සේවක අර්ථසාධක අරමුදලෙහි (සේ.අ.අ.) සියළුම සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඊට අමතරව සේවා දායකයන් පිළිබඳ ඇතැම් තොරතුරු ද එසේ රැස් කරනු ලැබේ.

- දැනට 57,000 ක් පමණ වූ සේවා ආයතන වෙතින් සාමාජිකයන් දශලක්ෂ 2.1 සඳහා දායක මුදල් අරමුදලට ලැබේ.
- මීට අමතරව, දශලක්ෂ 9.2 ක් පමණ වූ අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාවක් (මාසික දායක මුදල් නොලබන) අරමුදල විසින් පවත්වාගෙන යනු ලැබේ.
- මෙම අක්‍රීය ගිණුම් වලින් වැඩි ප්‍රමාණයක්, දැනට දායක මුදල් එවනු ලබන සාමාජිකයන් සේවය කළ පූර්ව සේවා ආයතන වලට සම්බන්ධ ගිණුම් බවට විශ්වාස කෙරේ.

## නැවත ලියාපදිංචි කිරීම යනු කුමක් ද?

- ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නමින් හා එහි අංකය සාමාජික අංකය ලෙස භාවිතා කරමින් අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් නැවත ලියාපදිංචි කරනු ලැබේ.
- නැවත ලියාපදිංචි කිරීමෙන් පසුව තම සේවා ආයතනය වෙනස් වුවද, සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක සේ.අ. අරමුදලේ තම සාමාජික අංකම වේ.
- සාමාජිකයින්ගේ පූර්ව සේවා ගිණුම් අළුතින් ජනනය කරන ලද ගිණුම් සමඟ ඒකාබද්ධ වනු ඇත.
- ගිණුම් හිමියන්ගේ ඇඟිලි සලකුණු විද්‍යුත් මාධ්‍යයෙන් ලබා ගෙන ඔවුන්ගේ සාමාජික ගිණුම් වලට සම්බන්ධ කෙරේ.

## නැවත ලියාපදිංචි කිරීම මගින් ලැබෙන ප්‍රතිලාභ :

**සාමාජිකයන්ට :**

- සේවා ආයතනය වරින් වර වෙනස් වුවද විශ්‍රාම ප්‍රතිලාභ ලැබෙන තෙක් තමන්ටම අනන්‍ය වූ ගිණුම් අංකයක් සෑම සාමාජිකයකුටම ලැබීම සහතික වීම.
- මාසික දායක මුදල් ඉක්මනින් හා නිවැරැදිව සාමාජික ගිණුමට බැර වීම සහතික වීම.
- සම්පූර්ණ විශ්‍රාම ප්‍රතිලාභය දින කිහිපයකින් ලබා ගැනීමට හැකිවීම.
- සාමාජිකයාගේ පූර්ව සේවා ගිණුම් සේවා ආයතනය වෙනස් වීමත් සමඟ ස්වයංක්‍රීයව ඒකාබද්ධ වීම.
- ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ දී පූර්ව සේවා ආයතන වලට සම්බන්ධ ප්‍රතිලාභ අයදුම් කිරීමට නොහැකි වීමෙන් සිදු විය හැකි මූල්‍යමය අලාභ පිළිබඳ අවදානම සම්පූර්ණයෙන් නැති වීම.
- සේවා ආයතනය විසින් සාමාජිකයින් වැඩි දෙනෙකුට වරින් වර එකම ගිණුම් අංකය ලබා දීම නිසා සාමාජිකයින් හට අනවශ්‍ය ප්‍රශ්න මතු නොවීම.
- වෙනත් පාර්ශවයන් විසින් සාමාජික ප්‍රතිලාභ වංචාකාරී ලෙස ලබා ගැනීමේ අවදානම සම්පූර්ණයෙන් තුරන් කිරීම.
- තම අයිතිය තහවුරු කිරීම සඳහා ප්‍රතිලාභ අයදුම් කිරීමේ දී විවිධ ලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවීම.
- විවිධ සාමාජික ගිණුම් අංක වෙනුවට එක් අංකයක් පමණක් (සාමාජිකයාගේ ජා.හැ.ප. අංකය) මතක තබා ගැනීමේ පහසුව.

- අනාගතයේ දී ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පත් ජංගම දුරකථන හෝ අන්තර් ජාලය භාවිතා කරමින් බැංකු ක්‍රමය මගින් තම ගිණුමේ ශේෂය දැනගැනීමේ පහසුව සාමාජිකයින් හට ලැබෙනු ඇත.
- දැනට සාමාජික මුදල් නොලබන, අක්‍රිය ගිණුම් හිමි සාමාජිකයන් හට තම වාර්ෂික ගිණුම් වාර්තා ලබාගැනීමේ හැකියාව.

**සේවායෝජකයන්ට :**

- සේවකයින්ගේ නම් හා ගිණුම් අංකයන්හි පවතින විෂමතාවයන් නිවැරදි කිරීම සඳහා ලිපි නිකුත් කිරීම පිළිබඳ අවශ්‍යතාවයෙන් සම්පූර්ණයෙන් නිදහස් වීම.
- සාමාජික තොරතුරු පිළිබඳව ඉතා නිරවුල් වාර්තා තබා ගැනීමට හැකි වීම.
- සේවකයින් කිහිප දෙනෙකු සඳහා එක් සාමාජික අංකයක් නිකුත් වීමෙන් ඇති විය හැකි මූල්‍යමය අලාභ පිළිබඳ අවධානම නැති වීම.
- මාසික සාමාජික දායක මුදල් වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රේෂණය කිරීමට හැකිවන ලෙස, නව දත්ත පද්ධතිය විද්‍යුත් මාධ්‍යයෙන් රැස්කිරීමේ ක්‍රමයට සම්බන්ධ වීම.

**ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා සාමාජික වගකීම :**

මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සේව්‍ය සේවක දෙපක්ෂය විසින් නිසි කලට නිවැරදිව ලබාදෙනු ලබන තොරතුරු මත රඳා පවතිනු ඇත. සේවකයින් පිළිබඳ විස්තර පහත සඳහන් පෝරම මගින් එක් රැස්කරනු ලැබේ.

RR1 පෝරමය : ජා.හැ. අංක අනුව සාමාජිකයන් පිළිබඳ විස්තර. "සී3" කාණ්ඩයේ සේවායෝජකයින් යටතේ (සේවකයන් 150 වැඩි සේවා ආයතන) සේවය කරන සේවකයින් පිළිබඳ විස්තර සංයුක්ත (CD) තැටි අනුසාරයෙන් එක් රැස්කරනු ලැබේ.

RR2 පෝරමය : දැනට සේවය කරන ස්ථානයේ සාමාජිකයාගේ නම වෙනස් කිරීම සඳහා සිය අභිමතය ලබා ගැනීම අවශ්‍ය වූ අවස්ථාවක.

RR3 පෝරමය : පූර්ව සේවා ආයතන ගිණුම් අංක ඇත්නම් එම අංක නව අංකය යටතේ ඒකාබද්ධ කිරීම සඳහා සාමාජික අභිමතය ලබා ගැනීම.

සේවායෝජකයින් පිළිබඳ තොරතුරු RR4 පෝරමය මගින් රැස් කරනු ලැබේ.

සේවකයින්ගේ හා සේව්‍යයන්ගේ තොරතුරු එක්රැස් කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ බලයලත් නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වනු ඇත.

**පළමු අදියර :- දැනට දායක මුදල් එවනු ලබන සේවකයින්ගේ තොරතුරු එක්රැස් කිරීම.**

1. මෙම තොරතුරු රැස්කිරීම, 2007 සැප්තැම්බර් මාසයේ සිට ආරම්භ කෙරේ.
2. කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ බලයලත් නිලධාරීන් අදාළ සේවා ස්ථාන වෙත පැමිණ සක්‍රීය ගිණුම් හිමියන්ගේ ජාතික හැඳුනුම්පතේ තොරතුරු හා අනෙකුත් අදාළ තොරතුරු රැස්කරනු ඇත.

**දෙවන අදියර :- ඇඟිලි සලකුණ ලබා ගැනීම.**

1. විද්‍යුත් ක්‍රමය මගින් සෑම සක්‍රීය ගිණුම් හිමි සාමාජිකයකුගේම ඇඟිලි සලකුණ ලබා ගෙන සාමාජික ගිණුම්වලට සම්බන්ධ කිරීම ඉදිරි කාලයේ දී සිදු කරනු ඇත.

**තුන්වන අදියර :- දායක මුදල් නොඑවනු ලබන සාමාජික තොරතුරු රැස්කිරීම.**

1. මෙම තොරතුරු රැස්කිරීම 2008 ජනවාරි මස ආරම්භ කරනු ලබන අතර, ඒ පිළිබඳ විස්තර ඉදිරි කාලයේ දී ජනමාධ්‍ය මගින් දැනුම් දෙනු ලැබේ.

නිවැරදි තොරතුරු සපයා දීම මගින්, මෙම ව්‍යාපෘතීන් සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය මෙයින් බලාපොරොත්තු වෙමු.